1st Place Winner
National Productivity
Award 2020

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/2/9//DO/OTHER | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.12. 08 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු/ අමාත්‍යාංශ ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තුගත ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් සභාවෙන් වැටුප් ගෙවීමේ පදනම මත වෙනත් පළාත් සභා සඳහා තාවකාලික අනුයුක්ත කිරීම අත්හිටුවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.11.25 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. එමගින්, දකුණු පළාත් සභාව මගින් වැටුප් ගෙවීමේ පදනම යටතේ වෙනත් පළාත් සභාවන් සඳහා තාවකාලික අනුයුක්තයන් ලබා දීම 2022.11.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව සඳහන් කර ඇත.

03. නමුත්, මෙම තීන්දුව හේතුවෙන් ඇතැම් නිලධාරීන් දැඩි අපහසුතාවට පත් වන බව නිරීක්ෂණය වන බැවින්, තාවකාලික අනුයුක්තයන් ලබා දීමට බාධාවක් නොවන පරිදි එකී තීන්දුව පහත අවස්ථාවන්හිදී සංශෝධනය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කර ඇති බව දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/TR/18 හා 2022.12.02 දිනැති ලිපිය මගින් මා වෙත දැනුම් දී ඇත. (ඇමුණුම 01)

I. දරු ප්‍රසූතියෙන් පසු ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ හිමි වරප්‍රසාදයන් ලබා ගත් පසු, නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කිරීමේ කොන්දේසියට යටත්ව තාවකාලික අනුයුක්තයන් ඉල්ලුම් කරන ගර්භනී නිලධාරීන් සඳහා ගර්භනී කාලය මාස 05ක් සම්පූර්ණ වූ පසු තාවකාලික අනුයුක්තයන් ලබා දීම.

II. හදිසි අනතුරුවලට ලක් වූ නිලධාරීන් විසින් එම හේතුව මත තාවකාලික අනුයුක්තයන් ඉල්ලුම් කරයි නම් සාධාරණ කාල සීමාවක් සඳහා පමණක් තාවකාලික අනුයුක්තයන් ලබා දීම.

III. යම් නිලධාරියෙක් බරපතළ රෝගී තත්ත්වයකට පත්වීම හේතුවෙන් තාවකාලික අනුයුක්තයන් ඉල්ලුම් කරයි නම්, අදාළ කරුණු තහවුරු කරගැනීමෙන් පසු සාධාරණ කාලයක් සඳහා තාවකාලික අනුයුක්තයන් ලබා දීම.

04. ඒ අනුව, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத் தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

4184

"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| මගේ අංකය<br>எனது இல.<br>My Number | G/SP/3/3/TR/18 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2022/ 12/ 02 |
|---|---|---|---|---|---|

05 DEC 2022

ACS/P

ලැබුණා. 2022 | 12 | 05

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් සභාවෙන් වැටුප් ගෙවීමේ පදනම මත වෙනත් පළාත් සභා සඳහා තාවකාලික අනුයුක්ත කිරීම අත්හිටුවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/2/9/DO/OTHER හා 2022.11.25 දිනැති ලිපියට පාදක වූ මාගේ සමාංක හා 2022.11.21 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඔබගේ අංක CSS/2/9/DO/OTHER හා 2022.11.16 දිනැති ලිපියේ ඉදිරිපත් කරන ලද නිර්දේශ පරිදි දකුණු පළාත් සභාව මගින් වැටුප් ගෙවීමේ පදනම යටතේ වෙනත් පළාත් සභාවන් සඳහා තාවකාලික අනුයුක්තයන් ලබා දීම 2022.11.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දෙන ලදී.

03.එහෙත් මෙම තීන්දුව හේතුවෙන් ඇතැම් නිලධාරීන් දැඩි අපහසුතාවට පත් වන බව නිරීක්ෂණය වන බැවින්, එම තීන්දුව පහත සඳහන් අවස්ථාවන්හිදී තාවකාලික අනුයුක්තයන් ලබා දීමට බාධාවක් නොවන පරිදි සංශෝධනය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

1. දරු ප්‍රසූතියෙන් පසු ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ හිමි වරප්‍රසාදයන් ලබා ගත් පසු, නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කිරීමේ කොන්දේසියට යටත්ව තාවකාලික අනුයුක්තයන් ඉල්ලුම් කරන ගර්භනී නිලධාරිනියන් සඳහා ගර්භනී කාලය මාස 05ක් සම්පූර්ණ වූ පසු තාවකාලික අනුයුක්ත ලබා දීම
2. හදිසි අනතුරුවලට ලක් වූ නිලධාරීන් විසින් එම හේතුව මත තාවකාලික අනුයුක්ත ඉල්ලුම් කරයි නම් සාධාරණ කාලසීමක් සඳහා පමණක් තාවකාලික අනුයුක්ත ලබා දීම
3. යම් නිලධාරියෙක් බරපතල රෝගී තත්ත්වයකට පත්වීම හේතුවෙන් තාවකාලික අනුයුක්තයක් ඉල්ලුම් කරයි නම්, අදාළ කරුණු තහවුරු කර ගැනීමෙන් පසු සාධාරණ කාලයක් සඳහා පමණක් තාවකාලික අනුයුක්ත ලබා දීම

දීපිකා කේ. ගුණරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

පිටපත: ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk